බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2026

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරෙහි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වැටුප් පරිමාණය

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ව 10/2025 අනුව රු.71,240 -11×1360 -18 ×1850-119,500/- වේ. වැටුප් කේත අංකය MN 7-2025 වේ.

03. සේවා කොන්දේසි

i) මෙම තනතුර ස්ථීරය. විශ්‍රාම වැටුප් සහිතය.

ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා බස්නාහිර පළාත් සභාවේ ආයතන සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයටද, රජයේ හා බස්නාහිර පළාත් සභාවේ මූදල් රෙගුලාසි වලටද, දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරී බඳවා ගැනීමේ පරිපාටියටද , රජයේ හා බස්නාහිර පළාත් සභාවේ වෙනත් රෙගුලාසි වලටද, චක්‍රලේඛ හා උපදෙස් වලටද , ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද ඔබ යටත් විය යුතු වේ.

04. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 01 ක් පවතී. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2026.12.02** දින වේ.

05. සුදුසුකම්

5.1. පළපුරුද්ද

(i) බස්නාහිර පළාත් ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරේ 1 (පළමු) පන්තියේ නිලධාරියෙක් වීම.

(ii) අයදුම්පත් කැඳවන දිනට වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ පාලන චක්‍රලේඛ අංක 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූල විනය දඬුමක් ලබා නොතිබිය යුතුය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය

5.2. කායික සුදුසුකම්

තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.3. වෙනත්

පහත සඳහන් පරිදි වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය:

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් යුක්ත වීම

(iii) මෙම තනතුරට බඳවා ගැනීමට අදාළ නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් **2026.12.02** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. බඳවා ගැනීමේ ක්‍රමය

පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්පත් ලැබී ඇති අවස්ථාවක දී හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සම ලකුණු ලබා ඇති අවස්ථාවකදී ලිඛිත විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා ගන්නා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පිරවිය යුතුය. එසේ නොවන අවස්ථාවලදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පමණක් පුරප්පාඩු පිරවිය යුතුය.

07. ලිඛිත විභාගය පිළිබඳ විස්තර:

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
1. ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය ඇසුරෙන්	පැය 01	100	40%
2. බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය, ආයතන සංග්‍රහය හා බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති	පැය 01	100	40%

08. **ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය:**

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
1. ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය	ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය අසුරෙන්
2. (I) බස්නාහිර පළාත් මූල්‍ය රීති	I,II,III,VI,V පරිච්ඡේද පිළිබඳ දැනුම
(II) බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය, ආයතන සංග්‍රහය	බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහයේ VIII, IX, XII, XXVIII, XXXII, XXXVI පරිච්ඡේද හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII, XLVIII පරිච්ඡේද පිළිබඳ දැනුම

09. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර:**

ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ		උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
i. පශ්චාත් උපාධියක් (පහත විෂයන් සඳහා - සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව,ප්‍රජා සංවර්ධනය,ග්‍රාම සංවර්ධනය , ප්‍රාදේශීය සංවර්ධනය)	ලකුණු 15		40
ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් මාස 12කට නොඅඩු (i හි සඳහන් විෂයන් සඳහා) පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්	10	25	
iii. සේවා පළපුරුද්ද පළමුවන ශ්‍රේණියේ සේවා කාලය සඳහා පාලන වක්‍රලේඛ 1/2022 අනුව ලකුණු ලබා දෙනු ලැබේ	50		
iv. ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ ව්‍යාපෘති වාර්තා (එක් ව්‍යාපෘතියක් සඳහා ලකුණු 05යි)	20	75	
v. පෞරුෂය	05		

10. **විභාග ගාස්තු**

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුවේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 1200.00 කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුල පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

11. අයදුම් කිරීමේ ක්‍රමය:

(i) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමු පිටුවටද, අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.12.02** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිළධාරි තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2026"** යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම්(බ.ප) මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

(iii) අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැල්දී නැතිවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසන් දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරු විසින් විඳ දරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

12. විභාගයට ඇතුල්වීම:

(i) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර , එහිදී තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නිතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. අපේක්ෂකයාගේ අනන්‍යතාවය:

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සැහිමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i) ජාතික හැඳුනුම්පත
ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii) වලංගු රියදුරු බලපත්‍රය

14. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ. එමෙන්ම ඔහුට/ඇයට පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර ,මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට රජයේ සේවයෙන් පහ කිරීමට වුවද යටත් වේ.

15. විභාග ක්‍රමය:

i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.
ii) මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

16. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කල හොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

17. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

18. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

19. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

නීලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

2026.11.05 දින,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 628,
10 මහල , ජනජය සිටි ගොඩනැගිල්ල
නාවල පාර ,
රාජගිරිය.

ආදර්ශ අයදුම්පත්‍රය

පළාත් සභා රාජ්‍ය සේවයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ තරඟ විභාගය - 2026

විභාග අංකය

(කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

01 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -.....
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
.....
(උදා: H.M.S.K.GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-
.....

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

02 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය -(අදාළ කොටුව තුළ √ යොදන්න)

පුරුෂ - ස්ත්‍රී

03 3.1 විවාහක/අවිවාහක බව- (විවාහක-2, අවිවාහක- 1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය වර්ෂය: මාසය: දිනය:

3.3 වයස අවුරුදු: ..... මාස..... දින .....

04 4.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
.....
.....

ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්)
.....
.....

4.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:

i. සිංහලෙන්/දෙමළෙන්-.....

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්-.....

4.3 දුරකථන අංකය:

රාජකාරී ජංගම

- විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.SMS පණිවිඩ නොලැබීම සම්බන්ධයෙන් පසුව කරනු ලබන පැමිණිලි සලකනු නොලැබේ.

05. 5.1 දැනට දරණ තනතුර: .....

5.2 එම තනතුර ස්ථිරද, තාවකාලිකද,අනියමිද යන්න : .....

5.3 එම තනතුරට පත්වීමේ දිනය : .....

5.4 සේවය ස්ථිර කල දිනය : .....

5.5 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කල දිනය : .....

5.6 සේවා ස්ථානයේ නම සහ ලිපිනය : .....

06. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට දරණ තනතුරේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය පිළිබඳ විස්තර හා පාලන චක්‍රලේඛ 04/2021 සම්බන්ධ තොරතුරු

6.1 ග්‍රාම සංවර්ධන නිලධාරී පළමු පන්තියේ තනතුරට පත් වූ දිනය .....

6.2 තනතුරේ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? .....

6.3 වැටුප් රහිත නිවාඩු/වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද? .....

6.4 වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබේද? .....

6.5 පාලන චක්‍රලේඛ 04/2021 අනුව විනයානුකූලව කටයුතු කර තිබේද?, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරතිබේද? .....

6.6 ඉහත 6.5 සඳහා පිළිතුර"ඔව්"නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

.....

07. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - .....

ලදුපත් අංකය - .....

දිනය - .....

ලදුපත මෙම කොටුව තුල නොඟැලවෙන සේ අලවන්න

(ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ.ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

08. <u>අයදුම්කරුගේ සහතිකය</u>

.....

..... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය .....

.....

අයදුම්කරුගේ අත්සන

09 <u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>

(අනවශ්‍ය වචන කපා හරින්න)

9.1 මෙම ආයතනයේ සේවයේ නියුතු ..... මහතා/මහත්මියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව මෙම නිලධාරියා/නිලධාරිනිය කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කරන/නොකරන බවත්,

9.2 මෙම නිලධාරියා/නිලධාරිනිය ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරට අදාලව උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයා ගෙන ඇති/නැති බවත්,

9.3 මෙම නිලධාරියා/නිලධාරිනිය ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති/නැති බවත්,

9.4 මෙම නිලධාරියා/නිලධාරිනිය පාලන චක්‍රලේඛ 04/2021 අනුව විනයානුකූල දඬුවමකට ලක්වී ඇති/නැති බවත් එසේ සිදු කිරීමට අදහස් කරන බවත්/නොකරන බවත්,

9.5 මෙම නිලධාරියා/නිලධාරිනිය සේවා කාලය තුල වැටුප් රහිත නිවාඩු/ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇති/නැති බවත්,

සටහන - වැටුප් රහිත නිවාඩු/ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේ නම්, වැටුප් වර්ධක උපයාගෙන නොමැති නම්, විනය විරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර ඇත්නම් හෝ විනයානුකූලව කටයුතු කිරීමට හෝ අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න.

.....

.....

මෙම නිලධාරියා/නිලධාරිනිය බස්නාහිර පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුව සියළුම සුදුසුකම් සපුරා ඇති/නැති බව නිර්දේශ කරමි.

....

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

10. <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

බස්නාහිර පළාතේ ගරු ආඥ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරී බඳවා ගැනීමේ පරිපාටියට අනුව .....

මහතා / මිය/මෙනවිය සියළු සුදුසුකම් සපුරා ඇති බව සහතික කරමි.

දිනය ....

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

11. <u>අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ නිර්දේශය</u>

ඉහත අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය ....

අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ අත්සන හා නිල මුද්‍රාව